# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර )උපාධිය සඳහා ලියාපදිංචි කිරීම - 2026

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව සඳහා 2026 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වීමට සුදුසුකම් ඇති අයැදුම්කරුවන්ගෙන් 2025 දෙසැම්බර් මස 29 දින දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

### අධ්‍යාපන සුදුසුකම්

**(අ) දේශීය අයැදුම්කරුවන් සඳහා**

01) ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයෙන් සමත්වීම

හෝ

(02) ඕනෑ ම විෂය ධාරාවකින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය විෂයයන් තුනක් සහිතව සමත් වීම හා සාමාන්‍ය පොදු පරීක්ෂණයට අවම ලකුණු 30ක් ලබා තිබීම.

(බෞද්ධ විෂයයක් සහිත ව අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත් ව තිබීම හෝ පාලි, සංස්කෘත, සිංහල, ඉතිහාසය යන විෂයයන්වලින් එකක් සහිත ව සමත් ව තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ)

හෝ

(03) පිළිගත් විශ්වවිද්‍යාලයක (දේශීය හෝ විදේශීය) උපාධියක් හෝ ඊට සමාන යැ යි මෙම විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සමාන සුදුසුකම් ලබා තිබීම

හෝ

(04) ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ බුද්ධ ධර්ම / පාලි / සංස්කෘත / ඉංග්‍රීසි / දෙමළ භාෂාව / බෞද්ධ උරුමය උසස් ඩිප්ලෝමා පාඨමාලාවලින් එකක් සමත් වීම

හෝ

(05) ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ හෝ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දහම් සරසවිය උසස් ඩිප්ලෝමාව සමත් වීම හෝ දහම් සරසවිය ඩිප්ලෝමාව සමත් වීම හා ඉන්පසු වසර දෙකක දහම් පාසල් ගුරු සේවයේ කටයුතු කිරීම

හෝ

(06) පාසැල් / පිරිවෙන් ක්ෂේත්‍රයේ ස්ථිර පුහුණු ගුරු තනතුරෙහි වසර දෙකක හෝ ඊට වැඩි පළපුරුද්දක් ලබා තිබීම (මූලික සුදුසුකම් සහිතව)

හෝ

(07) අ.පො.ස (උසස් පෙළ) විභාගයට සමාන යැ යි ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි වෙනත් කවර හෝ පරීක්ෂණයකින් සමත් ව තිබීම.

**(ආ) විදේශීය අයැදුම්කරුවන් සඳහා**

(01) දේශීය අයදුම්කරුවන් සඳහා නියමිත ඉහත 01-07 දක්වා සඳහන් සුදුසුකම්වලින් එකක්

හෝ

(02) ලන්ඩන් (උසස් පෙළ) විභාගය හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට සමාන යැ යි විශ්වවිද්‍යාලයීය සනාතන සභාවට පිළිගත හැකි වෙනත් කිසියම් සුදුසුකමක් ලබා තිබීම.

**සැ.යු.**

- සියලු ම දේශීය අයදුම්කරුවන් පිරිවෙන් අවසාන විභාගය හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සිංහල විෂය හෝ දෙමළ විෂය සමග සම්මාන තුනක්වත් සහිත ව විෂයයන් හයකින් සමත් ව තිබිය යුතු ය.

## අයැදුම්පත් ලබාගන්නා ආකාරය

විස්තර හා අයදුම්පත **www.bpu.ac.lk** වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකි අතර විශ්වවිද්‍යාලයට පැමිණ ලබා ගන්නේ නම් සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පහත ලිපිනයේ පිහිටි පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානයෙන් ලබා ගත හැකි ය.

**සැ.යු.** ⋆ අයැදුම්පත් හා විස්තර වෙබ් අඩවිය ඔස්සේ හා විශ්වවිද්‍යාලයට පැමිණ ලබා ගන්නේ නම් දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202** දරන ගිණුමට බැර වන පරිදි **රු.1000/=**ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමග එම අයදුම්පත ඉදිරිපත් කළ යුතු වේ. බැංකුවට ගෙවීම් සිදු කරන ගෙවීම් පතෙහි ඔබගේ නම ඉදිරියෙන් **B.A**. ලෙස සංකේත අංකය යෙදීම අනිවාර්ය වේ.

⋆ ප්‍රමාණය ඉක්මවා ශිෂ්‍යයන් අයැදුම් කර ඇති අවස්ථාවක, විශ්වවිද්‍යාලය විසින් සකස් කරනු ලබන නිර්ණායකවලට අනුව තෝරා ගැනීම් සිදු කරන අතර, ඉහත (1), (2), (3), (4) සහ (5) යන සුදුසුකම් සඳහා මූලිකත්වය ලබා දී අනුපිළිවෙළින් ශිෂ්‍ය බඳවා ගැනීම සිදු කරනු ලැබේ. තෝරාගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව විශ්වවිද්‍යාලයේ සම්පත් මත තීරණය වන බැවින් විශ්වවිද්‍යාලය විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2025.12.29 වේ. එදිනට පෙර නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය

**සහකාර ලේඛකාධිකාරී,**<br>**පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,**<br>**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,**<br>**නො. 214,**<br>**බෞද්ධාලෝක මාවත,**<br>**කොළඹ 07**

යන ලිපිනයට යොමු කළ යුතු ය. අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**විමසීම්:-** දුරකථන අංක : 011-2580609 / 011-2502944

**ලේඛකාධිකාරී**<br>**පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,**<br>**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,**<br>**නො. 214, බෞද්ධාලෝක මාවත,**<br>**කොළඹ 07.**<br>**2025.11.18**